# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2021 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2021 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 ජූලි මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 10.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2021 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ජූලි මස 15 වන දින]

එල්.ඩී.—ඕ. 62/2017

### 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 43ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

2. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 43අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ පනතේ 43ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යඃ-

"පොලිස් ස්ථාන වෙත පැමිණීම මහෙස්ත්‍රාත්වරුන්ගේ කාර්යයක් බව

43ආ. (1) පොලිස් ස්ථානවල පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට ආරක්ෂිතව සිටින බවට සහතික කර ගැනීම සඳහා, මහෙස්ත්‍රාත්වරයකු පත්කර ඇත්තේ යම් අධිකරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් ද, ඒ අධිකරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති සෑම පොලිස් ස්ථානයකට ම යටත් පිරිසෙයින් සෑම මසකට එක් වරක්වත් පැමිණීම සෑම මහෙස්ත්‍රාත්වරයකුගේ ම කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, පොලිස් ස්ථානය වෙත පැමිණෙන මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) සැකකරු පුද්ගලිකව දැකබලා ගෙන එම සැකකරුගේ යහසාධනය, සුභසාධනය සහ එම සැකකරු එම පොලිස් ස්ථානයේ තබාගෙන සිටින්නේ කවර තත්ත්වයන් යටතේ ද යන්න පිළිබඳ සොයා බැලීම; සහ

(ආ) ඔහුගේ නිරීක්ෂණ සහ සැකකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් පැමිණිල්ලක් වාර්තාගත කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) යම් සැකකරුවකු වධදීමට ලක් වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක දී, වෛද්‍ය පරීක්ෂණයක් සඳහා එම සැකකරු අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලෙස ද, එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(4) එම සැකකරු වධදීමට ලක් වී ඇති බවට එම වෛද්‍ය නිලධරයාගේ වාර්තාව මගින් අනාවරණය වන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එම සැකකරුට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා ද, එම සැකකරු අත්අඩංගුවේ සිටින ස්ථානය වෙනස් කිරීම සඳහා ද විධාන ඇතුළත් උචිත ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) වධදීම සිදුකර ඇතැයි චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව අපරාධ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සඳහා නීතිපතිවරයාට හැකි කරවනු පිණිස, කරන ලදැයි කියනු ලබන වධදීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.